**සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු සමාගම -2017**

---

සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ (“සමාගම’) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභාලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ මෙහෙයුම් වලට අදාලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKAS) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“මණ්ඩලය”) වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගනණය සිදු කරන ලදී කෙසේ වුවද,මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් උචිත සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

---

(අ) 2012 දෙසැම්බර් 17 සිට 2016 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා සහ සමාලෝචිත වර්ෂය සඳහා පිළිවෙලින් රු. 1,828,164 සහ රු. 720,000 ක් වූ ඇමතුම් තැන්පතු මත පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2016 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ඉපැයීම් රු. 1,828,164 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අලාභය රුපියල් 720,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ ) ශේෂ පිරික්සුමේ අවිනිශ්චිත ශේෂයක් ලෙස පෙන්වා තිබුණු නිරවුල් නොවී පැවති 2016 අප්‍රේල් 01 දිනට රු. 278,519 ක් වූ බැංකු ශේෂයේ නොසැසඳූ වෙනස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිල දී ගත් 2017 දෙසැම්බර් 31 දිනට මාර්ගස්තව පැවති රු. 25, 549,090 ක් වූ සිසිලන අයිතම `සහ රාක්ක මාර්ගස්ත තොග වශයෙන් ගිණුම් ගත කිරීම වෙනුවට සාවද්‍ය ලෙස විකුණුම්වලට බැර කර හරවා එවූ විකුණුම් වශයෙන් සමාගමේ ණය ගැතියකුට හර කර තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට ණය හිමි ශේෂය තුළ ඇතුළත් ඍණ ශේෂයන් හේතුවෙන් වෙළඳ ණයහිමියන් රු.694, 869 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ඉන්වොයිසි, ඉදිකිරීම් ලේඛනය, ප්‍රමාණ බිල්පත්, කොන්ත්‍රාත් ගිවිසුම්, කළ වැඩ වාර්තා, භාණ්ඩ ලැබීමේ කුවිතාන්සි සහ ගෙවීම් වවුචර නොමැති වීම හේතුවෙන් එකතුව රු. 463,509,438, ක් වූ ආදායම් ගිණුම් දෙකක් එකතුව රු. 671,718,187 ක් වූ වියදම් ගිණුම් දෙකක් එකතුව රු. 335,368,198 ක් වූ ගෙවිය යුතු ගිණුම් හතරක් සහ එකතුව රු. 298,912,974 ක් වූ ලැබිය යුතු ගිණුම් දෙකක් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය ව්‍යාචනය**

මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියම කරන පරිදි මා විසින් පහත සඳහන් ප්‍රකාශ සිදුකරමි.

(අ) මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය හා සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ:

ඉහත දක්වා ඇති පරිදි විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට සහ කළමනාකරණ තීරණවලට නුකූල නොවීම**

**3. මූල්‍ය සමාලෝචනය**

| | **නීති / මග පෙන්වීම සඳහා යොමුව** | **විස්තරය** |
|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී / 12 | |
| 1 | 5.2.5. වගන්තිය | වාර්ෂික අයවැය ලේඛනය සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 11 | 9.2 වගන්තිය | සමාගම සඳහා කාර්ය මණ්ඩල සංඛ්‍යා සකස් කර අනුමත කර නොතිබුණි. |

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් ලද ප්‍රතිඵලය රු. 2,410,504 ක බදු පසු ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය රු. 1,390,333 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,800,837

ක පිරිහීමක් පෙන්නුම් කරන ලදී. මූල්‍ය ආදායම රු. 3,493,771 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් 2012 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ් /2009(1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සමාගම විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 4.4 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
|---|---|
| (අ) වත්කම් කළමනාකරණය | සමීක්ෂණ මණ්ඩල මගින් වත්කම් සත්‍යාපනය කර නොතිබීම |
| (ආ) ගිණුම්කරණය | ලෙජරයේ ගිණුම් ශේෂයන් උපයෝගී ලේඛන සමඟ තහවුරු කර ගැනීමට නොහැකිවීම |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | කාර්ය මණ්ඩල සංඛ්‍යා සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා නොගැනීම |